# 2017 දෙසැම්බර් මස 02 වන දින පැවැත්වූ, විශේෂ මහා සභා රැස්වීමේදී සංශෝධිත, ලංකා බැංකුවේ විශ්‍රාමික සංගමයේ ව්‍යවස්ථාව

## 2018 ජනවාරි මස පළමුවැනිදා සිට බලපැවැත්වේ.

### 1. නම

මෙම සංගමයේ නම, ''ල්' ංකා බැංකුවේ විශ්‍රා
ව්‍යවහාර වන අතර, මින් මතු "ස' ංගමය යනුවෙන් සඳහන් වනු ඇත

### 2. ලිපිනය

කොළඹ 01, අංක 41, ශ්‍රීමත් රසික් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය) ලංකා බැංකුව නගර ශාඛාව ගොඩනැගිල්ල, පළමුවන මහල යන ස්ථානය හෝ කළමනාකරණ කමිටුව මගින් තීරණය කරනු ලබන වෙනත් ස්ථානයක් හෝ සංගමයේ ලිපිනය වනු ඇත.

### 3. අරමුණු

සංගමයේ අරමුණු වනුයේ,

I. සංගමයේ සාමාජිකයින්ගේ සුභසාධනය වර්ධනය කරන අතර, ඔවුන් අතර මෙන්ම මින්මතු "බ' ැංකුව යනුවෙන් හඳුන්වන ලංකා බැංකුව සමග සුහද සබඳතාවක්ද පවත්වාගෙන යාම,
II. සාමාජිකයන්ගේ උන්නතිය, අයිතිවාසිකම් හා වරප්‍රසාද වර්ධනය කරමින් පවත්වාගෙන යාම සහ ඒවා තවදුරටත් ආරක්ෂා කිරීම,
III. සාමාජිකයින් අතර අන්‍යෝන්‍ය සුහදතාවය වර්ධනය කිරීම,
IV. කළමනාකරණ කමිටුව, දිස්ත්‍රික් ශාඛා හා දිස්ත්‍රික් ශාඛාවල විමධ්‍යගත අස්තිත්ව (Entities) තුළින් පොදුවේ සංගමයේ සාමාජිකයින්ගේ හා පොදු මහජනතාවට අදාළ සමාජ සත්කාර හා සුභසාධන කටයුතුවල යෙදීමටත්, එම කටයුතු රීති අංක 26 (iv) හි දක්වා ඇති කොන්දේසි හා සීමාවන්ට යටත්ව, පොදු ජන යහපත අරභයා පමණක්ම සිදු කිරීම.

### 4. සාමාජිකත්වය

### IV.1. සාමාජිකත්වය ලබාගත හැක්කේ

I. බැංකුවේ සේවයෙන් විශ්‍රාම ලබා මාසික විශ්‍රාම වැටුපක් ලබමින් සිටින සියලුම සේවකයන්ට,

II. ලංකා බැංකුවේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදල යටතේ මාසික විශ්‍රාම වැටුපක් ලබන විශ්‍රාමලත් සේවකයන්ගේ වැන්දඹු භාර්යාවන්ට හා ස්වාමි පුරුෂයන්ට,

## IV.2. ඉල්ලුම් කිරීම

**i.** සාමාජිකත්වය අපේක්ෂා කරන අය විසින් (අ) ඉල්ලුම්පතක් හා (ආ) අයදුම්කරුගේ මාසික විශ්‍රාම වැටුපෙන්, මාසික දායක මුදල සංගමය වෙත ප්‍රේෂණය කිරීමට බලය පවරමින් බැංකුව අමතන ලද බලපැවරුම් ලිපියක් අදාල පරිදි විශ්‍රාම ලබා මාස 03 ක් ඇතුළත හෝ කලත්‍රයාගේ අභාවයෙන් මාස 03 ක් ඇතුළත ලබා දිය යුතුය. (මේ සඳහා අවශ්‍ය පෝර්ම මාසික විශ්‍රාම වැටුප ගෙවීමට කටයුතු කරනු ලබන බැංකුවේ අදාළ දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගත හැකි අතර, නිසි ලෙස සම්පූර්ණ කර අත්සන් කරන ලද පෝර්ම එම දෙපාර්තමේන්තුව වෙත භාරදිය යුතුය, වර්තමානයේ විශ්‍රාම නඩත්තු අංශය)

## IV.3. පමා වී ලැබෙන ඉල්ලුම්පත්

නියමිත කාලසීමාව පසුවී ලැබෙන ඉල්ලුම්පත්, සාමාජිකත්වය ලැබීම සඳහා සුදුසුකම් ලබන පළමු දිනයේ පටන්, සියලුම හිඟ □□□□ මුදල් ගෙවීමෙන් අනතුරුව, කළමනාකරණ කමිටුව විසින් භාර ගැනීමට ඉඩ ඇත. හිඟදායක මුදල් සම්බන්ධව සිද්ධියට අදාළ යෝග්‍යතාව මත, කළමනාකරණ කමිටුව මගින් විකල්ප තීරණයක් ගත් විටෙක හැර, ඉහතින් දැක්වෙන කොන්දේසිය බලපවත්වයි.

## IV.4. මූල්‍ය ප්‍රතිලාභ සඳහා සුදුසුකම්

හිඟදායක මුදල් සමග ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත භාරදී මාස 03 ක් ඉක්මවන තෙක්, බැංකුවේ විශ්‍රාමිකයකු, වැන්දඹුවක හෝ වැන්දඹු ස්වාමි පුරුෂයකු විසින් පමාවී භාරදෙනු ලබන ඉල්ලුම්පතක් වෙනුවෙන් සංගමයේ කවර යෝජනා ක්‍රමයකින් හෝ අරමුදලකින් කිසිදු මූල්‍ය ප්‍රතිලාභයක් ලැබීමට සුදුසුකම් නොලබන්නේය.

## 5. ඉල්ලා අස්වීම

සංගමයේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමට කැමති ඕනෑම අයෙකුට, ඒ බැව් දන්වා සංගමයේ ප්‍රධාන □□□□□ □□□ □□□□□ නිවේදනයක්, ලිත් මාසයකට පෙර ලබා දීමෙන් එය සිදු කළ හැකිය. (මින් මතු ප්‍රධාන □□□□□ □□□□□□ □□□□□□□□ □□□)

## 6. සංගමයේ කටයුතු කළමනාකරණය

සංගමයේ කටයුතු කළමනාකරණය සිදු විය යුත්තේ,

i. මධ්‍යම කාරක සභාව මගින්

ii. කළමනාකරණ කමිටුව මගින්

## 7. සංගමයේ සංයුතිය

### 7.1. මධ්‍යම කාරක සභාව

සංගමයේ පාලන අධිකාරියයි.

(රීති අංක 7.1 හි උප රීතිවල වැඩිදුරටත් විස්තර වේ.)

### 7.2. කළමනාකරණ කමිටුව

සංගමයේ මෙහෙයුම් ක්‍රියාත්මක කරවනු ලබන අධිකාරියයි. නිලධාරින්ගෙන් සහ කමිටු සාමාජිකයින්ගෙන් සමන්විතය.

(රීති අංක 7.2 හි උප රීතිවල වැඩිදුරටත් විස්තර වේ.)

### 7.3. උපදේශක කවුන්සිලය

සංගමයෙහි උපදේශන අධිකාරිය වන්නේය.

(රීති අංක 7.3 හි උප රීතිවල වැඩිදුරටත් විස්තර වේ.)

### 7.4. දිස්ත්‍රික් ශාඛා

දිස්ත්‍රික්කයෙහි/ දිස්ත්‍රික්කයන්හි සාමාජිකත්වය නියෝජනය කරනු ලබන ආයතනයයි.

(රීති අංක 7.4 හි උප රීතිවල වැඩිදුරටත් විස්තර වේ.)

### 7.5. දිස්ත්‍රික් ශාඛාවන්හි විමධ්‍යගත අස්තිත්ව (Entities)

දිස්ත්‍රික් ශාඛාවල වෙනස්, යාබද ඒකක නියෝජනය කරන ආයතනයයි.

(රීති අංක 7.5 හි උප රීතිවල වැඩිදුරටත් විස්තර වේ.)

### 7.6. අනුබද්ධ විදේශ ශාඛා

එක් එක් විදේශ රටක වාසය කරන විශ්‍රාමිකයින් විසින් පිහිටුවා ගනු ලබන ශාඛා මෙම ගණයට අයත් වේ.

(රීති අංක 7.6 හි උප රීතිවල වැඩිදුරටත් විස්තර වේ.)

### 7.1.1. මධ්‍යම කාරක සභාවේ සංයුතිය

පහත දැක්වෙන රීති අංක 7.4.3 (i) පරිදි දිස්ත්‍රික්ක ශාඛාවලින් තෝරාපත් කරගත් නියෝජිතයින්ගෙන් සමන්විත වේ.

### 7.1.2. මධ්‍යම කාරක සභාවේ බලතල

මධ්‍යම කාරක සභාව සංගමයෙහි පාලන අධිකාරිය වන අතර, පහත දැක්වෙන බලතල එම කමිටුව සතුය.

i. වාර්ෂික මහා සභා රැස්වීමේදී මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින් අතරින් කළමනාකරණ කමිටුව හා මරණාධාර අරමුදල්/ අනෙකුත් අනුබද්ධ අරමුදල්වල කමිටු තෝරාපත් කර ගැනීම.

ii. කළමනාකරණ කමිටුව පාලනය කිරීම, මෙහෙයවීම හා කළමනාකරණ කමිටුවෙහි ඕනෑම තීරණයක් තහවුරු කිරීම, සංශෝධනය කිරීම, ප්‍රතික්ෂේප කොට බැහැර කිරීම.

iii. සංගමයෙහි අරමුණු තවදුරටත් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හා අවස්ථානුකූල යැයි සැලකෙන අන්දමින් ක්‍රියා කිරීම.

### 7.2.1. කළමනාකරණ කමිටුවෙහි සංයුතිය

**අ). නිලධාරීන් (9)**

සභාපති
උප සභාපතිවරුන් (03)
මහ ලේකම්
උප ලේකම්වරුන් (02)
භාණ්ඩාගාරික
උප භාණ්ඩාගාරික

**ආ). ආසන්නතම හිටපු සභාපති (නිල බලයෙන්)**

**ඇ). කමිටු සාමාජිකයින් (11)**

මරණාධාර අරමුදලෙහි සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික නිලබලයෙන් කමිටු සාමාජිකයින් වන්නේය,

- ආරම්භයේදී කමිටු සාමාජිකයින් හයදෙනෙකු (06) තෝරාපත් කරගනු ලබන අතර, හා

    - තෝරාපත් කරගනු ලැබූ කමිටුව, නියෝජනය නොවන, දිස්ත්‍රික් ශාඛා නියෝජනය වන පරිදි වෙනත් සාමාජිකයින් දෙදෙනෙක්.

### 7.2.2. කළමනාකරණ කමිටුවෙහි බලතල

i. සංගමයෙහි අරමුණුවලට අදාළ විෂය පථය තුළ සියලු කාරණා සම්බන්ධයෙන් සංගමයෙහි සාමාජිකත්වය වෙනුවෙන් කටයුතු කිරීමේ බලය කළමනාකරණ කමිටුව සතු වේ.

ii. වියදම් හා ආයෝජන සඳහා අවසර ලබා දීම.

iii. සංගමයේ සහ අනුබද්ධ අරමුදල්වල වැඩකටයුතු සඳහා කාර්ය මණ්ඩලය තෝරාගැනීම, බඳවා ගැනීම හා අවශ්‍යවූ විටෙක එම සේවකයින්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම.

iv. විශ්‍රාම වැටුප, වෛද්‍ය හා ණය යෝජනා ක්‍රම සහ සාමූහික ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් මහා සාමාජිකත්වයට අදාළව කළමනාකරණ කමිටුව මගින් ගනු ලබන තීරණ අපරානුමැතිය සඳහා මතු එළඹෙන මධ්‍යම කාරක සභාව වෙත ඉදිරිපත් කරනු ඇත.

v. යම් දිස්ත්‍රික් ශාඛා කමිටුවක් ව්‍යවස්ථානුකූල නොවන පරිද්දෙන් හෝ මධ්‍යම කාරක සභාව/ කළමනාකරණ කමිටුව ලබා දුන් විධානයක් නොතකා හරිමින් කටයුතු කළ විටෙක හෝ දිස්ත්‍රික් ශාඛාවෙහි අරමුදල් වැරදි සහගත ලෙස කළමනාකරණය/ අපයෝජනය කළ විටෙක කළමනාකරණ කමිටුව විසින් එම දිස්ත්‍රික් ශාඛා කමිටුවෙහි ක්‍රියාකාරිත්වය අත්හිටුවා එම දිස්ත්‍රික් ශාඛාවෙහි කළමනාකරණය හා ගිණුම්, කළමනාකරණ කමිටුව වෙත තාවකාලිකව පවරාගෙන, ඉන් අනතුරුව පැවැත්වෙන ඊළඟ සභා වාරයෙහිදීම, මධ්‍යම කාරක සභාව වෙත වාර්තා කළ යුතුය.

vi. මධ්‍යම කාරක සභාව විසින් එම අත්හිටුවීමේ තීරණය අවලංගු කර, කටයුතු කළමනාකරණය ආපසු දිස්ත්‍රික් ශාඛා කමිටුව වෙත භාරදීම හෝ, දිස්ත්‍රික් ශාඛා කමිටුව විසුරුවා හැර, දිස්ත්‍රික් ශාඛාවේ කටයුතු කළමනාකරණය කිරීමේ බලය, වඩාත් යෝග්‍ය පරිදි කළමනාකරණ කමිටුවේ අධීක්ෂණය යටතේ, මාස 03 ක් ඇතුළත හෝ මීළඟ වාර්ෂික මහා සභා රැස්වීමේදී හෝ නව කමිටුවක් තෝරාපත් කර ගන්නා තෙක්, කළමනාකරණ කමිටුව වෙත පවරනු ලැබේ.

## 7.3.1. උපදේශක කවුන්සිලය

### 1. සංයුතිය

i. කළමනාකරණ කමිටුවේ සියලුම සාමාජිකයින්

ii. සියලුම දිස්ත්‍රික් ශාඛාවල සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික අතරින් කවර හෝ දෙදෙනෙක්

(**සටහන** : දිස්ත්‍රික් ශාඛාවක සභාපති/ ලේකම් හා භාණ්ඩාගාරික දැනටමත් කළමනාකරණ කමිටුවෙහි සාමාජිකයෙකු නම් හෝ යම් කිසි කාරණයක් හේතු කොටගෙන විධිමත් ලෙස රැස්වීම්වලට සහභාගි වීමට නොහැකි නම් හෝ අදාළ දිස්ත්‍රික් ශාඛාව විසින් වෙනත් ස්ථිර ආදේශකයකු/ ආදේශකයින් නම් කළ යුතුය.

### 2. රැස්වීම පවත්වනු ලබන වාර ගණන

අවම වශයෙන් රැස්වීම් 02 ක් (දෙකක්) හෝ අවශ්‍යතාවය අනුව වැඩි සංඛ්‍යාවක්

(සටහන : මෙයින් එක් රැස්වීමක් දිස්ත්‍රික් ශාඛාවල වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසු, සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමට කලින් පැවැත්විය යුතුය.)

### 3. මුලසුන

සංගමයේ සභාපති හෝ ඔහු/ ඇය නොමැති විටෙක උප සභාපතිවරුන්ගෙන් එක් අයෙකු විසින් මුලසුන හොබවනු ලබන්නේය.

### 4. ලේකම්

සංගමයෙහි මහලේකම් හෝ ඔහු/ ඇය නොමැති විටෙක උප ලේකම්වරුන්ගෙන් එක් අයෙකු රැස්වීම් කැ දවීමේ සහ එම රැස්වීම්වල වාර්තා පිළියෙළ කර තැබීමේ වගකීම දරයි.

### 5. අයිතිවාසිකම් හා වගකීම්

i. උපදේශක කවුන්සිලයේ සියලුම සාමාජිකයින් හට උපදේශක කවුන්සිලයෙහි වාර්තාවලට අමතරව කළමනාකරණ කමිටුවෙහි වාර්තා ලැබීමේ අයිතිය හිමිවේ.

ii. මධ්‍යම කාරක සභාව විසින් සලකා බැලීම සඳහා දිස්ත්‍රික් ශාඛා මගින් එවනු ලබන, රීති අංක 27 (ii) ට අනුකූලව සකස් කරන ලද යෝජනාවල අවශ්‍යතාව හා යෝග්‍යතාව තීරණය කිරීමේ බලය උපදේශක කමිටුව සතුය.

iii. දිස්ත්‍රික් ශාඛා මගින් එවනු ලබන යෝජනා/ ව්‍යවස්ථා සංශෝධන නිර්දේශ කිරීම/ ප්‍රතික්ෂේප කිරීම/ සංශෝධනය කිරීම/ සහ/ හෝ එම යෝජනා ඒකාබද්ධ කිරීම/ උපදේශක කවුන්සිලය මගින් සිදු කළ හැකිය.

iv. මධ්‍යම කාරක සභාව මගින් සලකා බලනු පිණිස උපදේශක කවුන්සිලය විසින් ස්වකීය යෝජනා/ ව්‍යවස්ථා සංශෝධන ඉදිරිපත් කළ හැකිය.

v. උපදේශක කවුන්සිලය මගින් සංගමයෙහි ත්‍රෛමාසික මූල්‍ය වාර්තා ලබා ගෙන ඒවා සමාලෝචනයට භාජනය කළ යුතු වේ.

vi. ප්‍රතිපත්ති සම්බන්ධයෙන් උපදේශක කවුන්සිලය විසින් කළමනාකරණ කමිටුව වෙත යෝජනා/ නිර්දේශ ඉදිරිපත් කළ හැකිය.

## 6. වියදම්

දිස්ත්‍රික් ශාඛාවල නියෝජිතයින් විසින් උපදේශක කවුන්සිලයෙහි රැස්වීම් සඳහා සහභාගි වීමට දරන ගමන් වියදම් අදාළ දිස්ත්‍රික් ශාඛා මගින් ප්‍රතිපූරණය කළ හැකිය.

## 7.4.1. දිස්ත්‍රික් ශාඛාවක් පිහිටුවීම

i. මධ්‍යම කාරක සභාවේ අභිමතය පරිදි දිස්ත්‍රික් ශාඛා පිහිටුවීම දිස්ත්‍රික් මට්ටමින් සිදු කළ හැක.

ii. දිස්ත්‍රික් ශාඛාවක් පිහිටු වීමට අවශ්‍ය අවම සාමාජික සංඛ්‍යාව (30) තිහකි. අවශ්‍ය අවම සාමාජික සංඛ්‍යාව නොමැති විටෙක එකම පළාත තුළ දිස්ත්‍රික් 02 ක් හෝ වැඩි ගණනක් එකතුවීමෙන් දිස්ත්‍රික් ශාඛාව පිහිටුවිය හැකි වේ.

## 7.4.2. දිස්ත්‍රික් ශාඛා කමිටුවෙහි සංයුතිය

දිස්ත්‍රික් ශාඛාවේ කමිටුව පහත දැක්වෙන අයුරින් සැකසේ.

## අ). නිලධාරි මඬුල්ල

සභාපති

ආසන්නතම හිටපු සභාපති
උප සභාපති
ලේකම්
භාණ්ඩාගාරික
උපලේකම්
උප භාණ්ඩාගාරික

**ආ). ආසන්නතම හිටපු සභාපති (නිල බලයෙන්)**

**ඇ). කමිටු සාමාජිකයින්**

කමිටු සාමාජිකයින් හය (6) දෙනෙකි.

**දිස්ත්‍රික් ශාඛාවක වාර්ෂික මහා සභා රැස්වීමේදී නිලධාරි මඩුල්ල සහ කමිටු සාමාජිකයන් ඡන්දයෙන් තෝරාපත් කර ගත යුතුය.**

### 7.4.3. දිස්ත්‍රික් ශාඛාවෙහි කාර්යයන්

i. වාර්ෂික මහා සභා රැස්වීමේදී සෑම සාමාජිකයින් 20 කට හෝ ඉන් කොටසකට එක් සාමාජිකයකු බැගින් වන සේ සංගමයෙහි මධ්‍යම කාරක සභාව වෙත නියෝජිතයින් තෝරාපත් කර ගත යුතුය.

දිස්ත්‍රික් ශාඛාවල සහ විමධ්‍යගත අස්තිත්වවල (Entities) කමිටු සාමාජිකයන් අනිවාර්යෙන් මධ්‍යම කාරක සභිකයන් නොවන අතර , ඔවුන්ද ඉහත සඳහන් අයුරින් තේරී පත් විය යුතුය.

දිස්ත්‍රික් ශාඛාවේ ලේකම් විසින් එලෙස තෝරාපත් කර ගත් නියෝජිතයින්ගේ නම් දින හතරක් (04) ඇතුළත මහලේකම් වෙත දැනුම් දීය යුතුය.

ii. පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් කළමනාකරණ කමිටුවට කරුණු ඉදිරිපත් කිරීම.

අ). විශ්‍රාම වැටුප්, වෛද්‍යාධාර, ණය, සුභසාධන සහ සේවාවන් හා සාමාජිකයන්ට බලපාන අනෙකුත් කරුණු.

ආ). සංගමයෙහි සුභසාධන හා සමාජ සත්කාර යෝජනා ක්‍රම.

iii. පහත දැක්වෙන අංක 26 (iv) හි සඳහන් කොන්දේසි හා සීමාවන්ට යටත්ව, ස්වකීය දිස්ත්‍රික් ශාඛාවෙහි සාමාජිකයින් සම්බන්ධයෙන් සුභසාධන හා සමාජ සේවා කාර්යයන්ට අදාළ තීරණ ගැනීම.

iv. දිස්ත්‍රික් ශාඛාවෙහි අරමුදල් භාවිත කරමින් කළමනාකරණ කමිටුව මගින් එක් එක් දිස්ත්‍රික් ශාඛාව වෙත අනුමැතිය ලබා දී ඇති කරුණු සහ කොන්දේසිවලට අනුව ස්වකීය සාමාජිකයින් වෙත කෙටි කාලීන අයකර ගත හැකි මූල්‍යාධාර ලබා දීම.

v. ස්වකීය සාමාජිකයින් අතර හා දිස්ත්‍රික්කය/ න් තුළ බැංකු ශාඛා කාර්ය මණ්ඩල අතර සුහදශීලී සබඳතා ඇති කර ගැනීම උනන්දු කරවීම.

vi. ත්‍රෛමාසික වාර්තා හා අවශ්‍ය යයි ඉල්ලා සිටි අවස්ථාවන්හීදී කළමනාකරණ කමිටුව වෙත වෙනත් වාර්තා ඉදිරිපත් කිරීම.

### 7.4.4. දිස්ත්‍රික් ශාඛාවක බලතල

i. මහ ලේකම් හරහා කළමනාකරණ කමිටුව වෙත ප්‍රතිපත්තිමය කරුණු ලිඛිතව නිර්දේශ කිරීම.

ii. එහි ආයෝජන සහ වියදම් දිස්ත්‍රික් කමිටුවේ අනුමැතිය ඇතිව සිදු විය යුතුය.

iii. සමාජයීය, සුබසාධන හා ආගමික ව්‍යාපෘතීන් සඳහා තමන් විසින්ම අරමුදල් එකතු කර ගැනීම.

iv. කෙසේ වෙතත්, කළමනාකරණ කමිටුවේ අනුමැතියෙන් තොරව මහා සාමාජිකත්වයට බලපාන කිසිදු කරුණක් අරභයා ඒකපාර්ශවීය තීරණ ගැනීමට දිස්ත්‍රික් ශාඛාවට බලය නොමැත.

v. දිස්ත්‍රික් ශාඛාවක විමධ්‍යගත අස්තිත්වයෙහි කළමනාකරණ කමිටුව ව්‍යවස්ථානුකූල නොවන පරිද්දෙන් හෝ මධ්‍යම කාරක සභාව / කළමනාකරණ කමිටුව/ දිස්ත්‍රික් ශාඛා කමිටුව ලබා දුන් විධානයන් නොතකා හරිමින් කටයුතු කළ විටෙක හෝ විමධ්‍යගත ඒකකයෙහි (Entity) අරමුදල් වැරදි සහගත ලෙස කළමනාකරණය/ අයථායෝජනය කළ බව දිස්ත්‍රික් ශාඛාව විසින් සොයා ගනු ලැබූ විටෙක හෝ දිස්ත්‍රික් ශාඛා කමිටුව විසින් විමධ්‍යගත අස්තිත්වයෙහි (Entity) කමිටුවේ ක්‍රියාකාරිත්වය අත්හිටුවා, දිස්ත්‍රික් ශාඛාවේ විමධ්‍යගත අස්තිත්වයෙහි (Entity) කටයුතු කළමනාකරණය හා ගිණුම් තාවකාලිකව භාරගෙන, ඒ බැව් කළමනාකරණ කමිටුව වෙත දන්වා සිටිය යුතුය.

vi. කළමනාකරණ කමිටුව විසින් එම අත්හිටුවීමේ තීරණය අවලංගු කිරීම හා කටයුතු කළමනාකරණය ආපසු දිස්ත්‍රික් ශාඛාවේ විමධ්‍යගත අස්තිත්වයෙහි (Entity) කමිටුව වෙත භාරදීම හෝ එම දිස්ත්‍රික් ශාඛාවේ විමධ්‍යගත අස්තිත්වය (Entity) විසුරුවා හැර, විමධ්‍යගත අස්තිත්වයෙහි (Entity) කටයුතු කළමනාකරණයට දිස්ත්‍රික් ශාඛාව වෙත බලය පැවරීම හෝ සිදු කෙරේ. මෙය සිදුකරනු ලබන්නේ වඩාත් යෝග්‍ය පරිදි දිස්ත්‍රික් ශාඛාවේ අධීක්ෂණය යටතේ, මාස 03 ක් ඇතුලත හෝ මීලග වාර්ෂික මහා සභා රැස්වීමේදී නව කමිටුවක් තෝරාගනු ලබන තෙක්ය.

### 7.5.1. දිස්ත්‍රික් ශාඛාවන්හි විමධ්‍යගත අස්තිත්ව (Entities)

i. සාමාජික සංඛ්‍යාව 100 ඉක්මවන දිස්ත්‍රික් ශාඛාවක කමිටුවට, එය තවදුරටත් උප අස්තිත්ව (Entities) වශයෙන් අදාළ දිස්ත්‍රික්කයෙහි වෙනස් යාබද භූගෝලීය ප්‍රදේශයන් තුළ ව්‍යාප්ත කිරීමෙන් , එකී භූගෝලීය ප්‍රදේශයේ වාසය කරන සාමාජිකයින් වැඩි සංඛ්‍යාවකගේ සහභාගීත්වය ලබා ගනිමින්, සංගමයෙහි අරමුණු තවදුරටත් සාර්ථක කර ගැනීම සඳහා කළමනාකරණ කමිටුවෙහි අනුමැතිය ඉල්ලා සිටිය හැක.

ii. පහත දැක්වෙන කරුණු සලකා බැලීමෙන් පසු කළමනාකරණ කමිටුවට ඒ සඳහා අනුමැතිය ලබා දිය හැකිය.

අ). යාබද භූගෝලීය ප්‍රදේශය අන්තර්ගත වන එබඳු එක් එක් උප අස්තිත්ව අවම වශයෙන් සාමාජිකයින් (30) තිස් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

ආ). අදාළ දිස්ත්‍රික් ශාඛාවෙහි සාමාජිකයින් වාර්ෂික මහා සභා රැස්වීමකදී/ විශේෂ මහා සභා රැස්වීමකදී පැමිණ සිටින සාමාජික සංඛ්‍යාවෙන් 2/3 ඡන්දයෙන් එම යෝජනාව සම්මත කළ යුතු අතර,

1. යෝජිත උප අස්තිත්වවලට (Entities) විමධ්‍යගත කිරීම
2. යෝජිත එක් එක් උප අස්තිත්වයන්හි (Entities) යාබද භූගෝලීය ප්‍රදේශය සීමා ලකුණු කිරීම සහ
3. සංගමයෙහි කළමනාකරණ කමිටුව මගින් උප අස්තිත්වයන් (Entities) සඳහා වන 7.5.2 යටතේ දක්වා ඇති නිර්දේශිත නීතිරීති හා රෙගුලාසි (ඇමුණුම (i) හි) නිර්දේශිත නීතිරීති, අනුගත කරගත යුතුය.

ඇ). දැනටමත් පවත්වාගෙන යන දිස්ත්‍රික් ශාඛාවන්හි විමධ්‍යගත අස්තිත්ව (Entities) ඉහත (3)හි දක්වා ඇති නීතිරීතිවලට අනුගත විය යුතුය.

### 7.5.2. දිස්ත්‍රික් ශාඛාවන්හි විමධ්‍යගත අස්තිත්ව □දහා බලපැවැත්වෙන රීති හා රෙගුලාසි

දිස්ත්‍රික් ශාඛාවන්හි විමධ්‍යගත අස්තිත්ව ස දහා නිතිරීති මෙම ලියවිල්ලෙහි ඇමුණුම් අංක 1 වශයෙන් අමුණා ඇත.

### 7.6.1. අනුබද්ධ විදේශ ශාඛා

i. එක් එක් විදේශ රටවල වෙසෙන ලංකා බැංකු විශ්‍රාමිකයින් විසින් සංගමයක් පිහිටුවා, සංගමයට අනුබද්ධ කර ගන්නා ලෙස ඉල්ලීමක් කළ හැකිය. මෙම සංගමය හැදින්වෙන නාමය “ලංකා බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය ........ නගරය හෝ රාජ්‍යය/ ජනපදය”

ii. ඉහත සඳහන් රීති අංක 7.4.1 (ii) හි දක්වා ඇති අවම සාමාජිකත්වය පිළිබඳ අවශ්‍යතාවයෙන් ඔවුන් නිදහස් වෙති.

iii. ඔවුන් මධ්‍යම කාරක සභාවෙහි සාමාජිකත්වය සඳහා අයිතිවාසිකම් නොලබන අතර, මහ ලේකම්ගේ ආරාධනයක් අනුව අනුබද්ධ සංගමයක නියෝජිතයෙකුට නිරීක්ෂකයකු ලෙස මධ්‍යම කාරක සභා රැස්වීමකට සහභාගි විය හැක.

iv. අනුබද්ධ ගාස්තුව වශයෙන් එක් වරක් පමණක් US # 100/= ක් හෝ ඊට සමාන ගණනක් ශ්‍රී ලංකා මුදලින් ගෙවිය යුතු වන්නේය.

v. මධ්‍යම කාරක සභාවට අවශ්‍ය යැයි හැඟුනහොත් කිසියම් විදේශ ශාඛා සංගමයක අනුබද්ධතාවය අවලංගු කළ හැකි වන්නේය.

## 8. මධ්‍යම කාරක සභාවේ/ කළමනාකරණ කමිටුවේ/ දිස්ත්‍රික් ශාඛාවන්හි/ දිස්ත්‍රික් ශාඛාවන්හි විමධ්‍යගත අස්තිත්වයන්හි □□□□□□□□□□□□□ □□□ □□□□, මරණය, ඉල්ලා අස්වීම්, ඉවත්වීම්/ පදිංචිය වෙනස් වීම

i. මධ්‍යම කාරක සභාවේ/ කළමනාකරණ කමිටුවේ/ දිස්ත්‍රික් ශාඛා කමිටුවල, දිස්ත්‍රික් ශාඛාවන්හි විමධ්‍යගත අස්තිත්ව කමිටුවල, සාමාජිකයින්ට ඊළගට එළැඹෙන මධ්‍යම කාරක සභාවෙහි/ දිස්ත්‍රික් ශාඛාවන්හි/ දිස්ත්‍රික් ශාඛාවන්හි විමධ්‍යගත අස්තිත්වයන්හි වාර්ෂික මහා සභා රැස්වීම් දක්වා, එම නිලතල දැරිය හැක.

ii. මරණය/ ඉවත්වීම/ ඉල්ලා අස්වීම හෝ යම් තැනැත්තකු නියෝජනය කරන දිස්ත්‍රික් ශාඛාව/ දිස්ත්‍රික් ශාඛාවෙහි විමධ්‍යගත අස්තිත්වය පිහිටි

ප්‍රදේශයෙන් පිට ප්‍රදේශයකට ඔහුගේ පදිංචිය වෙනස්වීමේදී , අදාළ වර්ෂාවසානය දක්වා එම පුරප්පාඩුව පිරවීමට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව එම කමිටුවට බලය ලැබෙන්නේය.

අ). නිලධාරියෙකුගේ පුරප්පාඩුව එම කමිටුවේ කමිටු සාමාජිකයෙකුගෙන්,

ආ).කමිටු සාමාජිකයෙකුගේ පුරප්පාඩුව, මධ්‍යම කාරක සභිකයෙකු, දිස්ත්‍රික් ශාඛා සාමාජිකයෙකු, විමධ්‍යගත අස්තිත්ව සාමාජිකයෙකුගෙන්,

iii. කළමනාකරණ කමිටුවෙහි/ දිස්ත්‍රික් ශාඛා කමිටුවෙහි/ දිස්ත්‍රික් ශාඛාවක විමධ්‍යගත අස්තිත්ව කමිටුවෙහි යම්කිසි සාමාජිකයකු අදාළ කමිටුවෙහි පූර්ව අනුමැතියකින් හෝ අදාල කමිටුවට පිළිගත හැකි කරුණු පැහැදිලි කිරීමකින් තොරව, කළමනාකරණ කමිටුවෙහි හෝ දිස්ත්‍රික් කමිටුවෙහි හෝ දිස්ත්‍රික් ශාඛාවක විමධ්‍යගත අස්තිත්ව කමිටුවේ හෝ අඛණ්ඩව සභාවාර (03) කට සහභාගි නොවුවහොත්, දින 14 ක් ඇතුළත ඒ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීමක් ඉදිරිපත් කර එය අදාළ කමිටුව මගින් පිළිගතහොත් හැර, එම සාමාජිකයා සිය තනතුරින් ඉවත්වූ ලෙස සලකනු ලබන්නේය.

iv. ඉහත 8 (ii) හි දක්වා ඇති කරුණුවලට සමාන හේතුවක් නිසා මධ්‍යම කාරක සභාවෙහි පුරප්පාඩුවක් ඇති වුවහොත්, ඉවත්වූ සාමාජිකයා විසින් නියෝජනය කරන ලද දිස්ත්‍රික් ශාඛාව විසින් , අවසන් නොවූ ඉතිරි නිලකාලය සඳහා, එම පුරප්පාඩුව පුරවනු ලබන්නේය.

## 9. විනයානුකූල ක්‍රියා පටිපාටිය

**9.1.** විනයානුකූල ක්‍රියාපටිපාටියටකට අවතීර්ණ විය හැකි වැරදි වනුයේ,

### 9.1.1. සුළු වැරදි

අ). සංගමයේ අරමුණුවලට පටහැනිව ක්‍රියා කිරීම.

ආ). සංගමය අපකීර්තියට පත් කිරීම.

ඇ). සංගමයේ නාමය පුද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා යොදා ගැනීම.

ඉ). සංගමයේ කිසිම අස්තිත්වයක හෝ අනුබද්ධ අරමුදලක නිලධාරියකු/ කමිටු සාමාජිකයෙකු වශයෙන් බලතල අනිසි ලෙස හෝ අයථා ලෙස පරිහරණය කිරීම.

ඊ). ඒ හා සමානවූ වෙනත් වැරදි.

### 9.1.2. බරපතල වැරදි

කිසිදු අස්තිත්වයක අරමුදල් හෝ අනුබද්ධ අරමුදල්

අ). අනිසි අන්දමින් පරිහරණය කිරීම

ආ). අපයෝජනය
ඇ). ඒ හා සමානවූ වෙනත් වැරදි

## 9.2. විනය කටයුතු සම්බන්ධ ක්‍රියාපටිපාටිය

**9.2.1.** සංගමයෙහි සාමාජිකයෙකු විසින් ඉහත 9.1 වගන්තියෙහි දැක්වෙන පරිදි, එක් වරදක් හෝ වැරදි කිහිපයක් සිදු කර ඇතැයි සංගමයෙහි සභාපතිවරයා (මින් මතු සභාපති) නමින් සඳහන් කෙරෙන දැනුවත් කළ විටෙක,

i. සභාපතිවරයා විසින්, කළමනාකරණ කමිටුවෙහි සාමාජිකයින් (02) දෙදෙනෙකුගෙන් සහ කළමනාකරණ කමිටුවේ සභාපති හෝ උපසභාපතිවරුන් හැර වෙනත් නිලධාරියකුගෙන් සමන්විත මූලික විමර්ශන කමිටුවක් (මූ.වි.ක.) පත් කර එම නිලධාරියා වෙත කමිටුවෙහි සභාපතිත්වය පවරනු ලබයි. එම කමිටුව මගින් මූලික විමර්ශන කටයුතු සිදු කර , දින 30 ක් ඇතුලත, විනිශ්චයක් සඳහා යොමු කළ යුතු දෘශ්‍යමාන සාක්ෂි පවතීද යන්න සම්බන්ධයෙන් වාර්තා කළ යුතුය.

ii. විනිශ්චය සඳහා යොමු කළ යුතු දෘශ්‍යමාන සාක්ෂි නොමැති බැව්, මූලික විමර්ශන කමිටුව මගින් තීරණය කරනු ලැබුවහොත්, එම කරුණු සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියා නොකරනු ඇත.

iii. 9.1.1. වගන්තියෙහි දැක්වෙන වැරදි සඳහා විධිමත් විනයානුකූල පරීක්ෂණයක් පැවැත්වීමට ප්‍රමාණවත් පදනමක් ඇතැයි, මූලික විමර්ශන කමිටුව වාර්තා කළහොත්, සංගමයෙහි සභාපතිවරයා විසින් නිශ්චිත දිනයකදී හා වේලාවකදී කළමනාකරණ කමිටුව (ක.ක.) හමුවේ පෙනී සිටින ලෙස අදාළ පුද්ගලයා වෙත ලියාපදිංචි කළ තැපැලෙන් දැනුම් දීමක් කර ඔහු වෙතින් නිදහසට කරුණු ඉදිරිපත් කිරීම හෝ චෝදනා ලිහිල් ලෙස සලකා, සමථයකට එළඹීමට අවස්ථාව ලබා දෙන ලෙස ආයාචනය කිරීමකට ඉඩ ලබා දෙනු ඇත. එයින් පසුව ඔහුගේ අනාභිමුඛයෙන් (ඔහු නොමැති තැන) කළමනාකරණ කමිටුව විසින් තීරණයකට එළඹ, අදාළ සාමාජිකයා නිදොස් කිරීම, හෝ ඉදිරියේදී මෙබඳු වැරදි සිදු කිරීමෙන් වැළකීම හෝ අවවාද කිරීම/ අනතුරු ඇඟවීම/ තරවටු කිරිම සිදු කරමින්, සභාපතිවරයා විසින් ලියාපදිංචි තැපැලෙන් කරනු ලබන දැනුම් දීම අඩංගු ලිපියෙහි සඳහන් දින සිට දින 14 ක් ඇතුළත, කළමනාකරණ

කමිටුවෙහි තීරණයට එරෙහිව සභාපතිවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අදාළ සාමාජිකයාහට අවකාශ ලැබෙනු ඇත.

iv. වගන්ති අංක 9.1.2. හි සඳහන් වැරදි එකක් හෝ දෙකකට අදාළව, විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා ප්‍රමාණවත් හේතු කාරණ ඇතැයි මූලික විමර්ශන කමිටුව මගින් වාර්තා කළහොත්, පහත දැක්වෙන වගන්ති අංක 9.3 යටතේ මූලික විනය පරීක්ෂණයක් ආරම්භ කරනු ඇත.

9.3. මූලික විනය පරීක්ෂණය වගන්ති 9.1.1 යටතේ චෝදනා සඳහා, විනය නියෝගයක් නිකුත් කරනු ලැබූ සාමාජිකයෙකු අවවාද කිරීම / අනතුරු ඇඟවීම/ තරවටු කිරීම යන නියෝගයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කළ විටෙක හෝ වගන්ති 9.1.2 යටතේ වැරදි එකක් හෝ දෙකක් සඳහා විධිමත් ලෙස චෝදනා ඉදිරිපත් කළ යුතු යැයි මූලික විමර්ශන කමිටුව විසින් නිර්දේශ කරනු ලැබූ විටෙක,

i. සභාපතිවරයා විසින්, චෝදනා සම්බන්ධව සවිස්තර හේතු දැක්වීමේ ලිපියක් නිකුත් කර , සාමාජිකයාට පිළිතුරු ලබා දීම සඳහා දින දහහතරක (14) කාලයක් ලබා දිය යුතුය.

ii. හේතු දැක්වීමේ ලිපියට පිළිතුරු ලැබීමෙන් අනතුරුව , ලබා දී ඇති පිළිතුර සම්බන්ධයෙන් කළමනාකරණ කමිටුව සෑහීමකට පත්වන්නේ නම් අදාළ කාරණය සම්බන්ධයෙන් වැඩිදුරටත් ක්‍රියා නොකරනු ඇත.

iii. ලබාදී ඇති පිළිතුර සම්බන්ධයෙන් කළමනාකරණ කමිටුව සෑහීමකට පත් නොවන්නේ නම්, සභාපතිවරයා විසින්, සංගමයේ උප සභාපතිවරයා කමිටු සභාපති වශයෙනුත්, මූලික විමර්ශන කමිටුවෙහි සාමාජිකයන් නොවූ, කළමනාකරණ කමිටුවෙහි සාමාජිකයන් දෙදෙනෙකු (2) සෙසු සාමාජිකයන් වශයෙනුත් සමන්විත විධිමත් පරීක්ෂණ මණ්ඩලයක් (විපම), විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා පත්කර එහි වාර්තාව, කමිටුව පත්කර සති හයක් (6) ඇතුළත සභාපතිවරයා වෙත ලබා දෙන ලෙස දැනුම් දිය යුතුය.

iv. සභාපතිවරයා විසින් චෝදනා සම්බන්ධයෙන් තිබෙන සියලුම ප්‍රධාන, වැදගත් සාක්ෂි, සොයාගැනීම්/ මූලික විමර්ශන කමිටුවෙහි නිර්දේශද ඇතුලත්ව, කළමනාකරණ කමිටුවෙහි තීරණය හා අදාළ වේ නම් කළමනාකරණ කමිටුවෙහි විනය නියෝගයට එරෙහිව සාමාජිකයාගේ අභියාචනයද, විධිමත් පරීක්ෂණ මණ්ඩලය වෙත (විපම) ලබා දිය යුතුය.

v. සභාපතිවරයා, විධිමත් පරීක්ෂණ මණ්ඩලයේ (විපම) සභාපතිවරයාගේ අදහස් විමසා බැලීමේ සාකච්ඡාවකින් අනතුරුව, විධිමත් විනය පරීක්ෂණය පැවැත්වෙන දිනය, වේලාව හා ස්ථානය සම්බන්ධයෙන් සාමාජිකයා හට දැනුම් දෙනු ඇත . (විධිමත් විනය පරීක්ෂණය පැවැත්වෙන දිනය අඩු තරමින් දැනුම් දීමේ දිනයට සති දෙකකට (2) පසුව විය යුතුය) සාමාජිකයාගේ අභිමතය පරිදි, සාමාජිකයා පැමිණ සිටින විට පමණක්, ඔහු නියෝජනය කිරීමට මිත්‍රයෙකු සහභාගි කරවිය හැකි අතර , එම මිත්‍රයා කළමනාකරණ කමිටුවේ හෝ අනුබද්ධ අරමුදල්වල කමිටු සාමාජිකයෙකු නොවන, සංගමයේ සාමාජිකයෙකු විය යුතු බව සභාපතිවරයා විසින් සාමාජිකයා වෙත දන්වා සිටිය යුතු අතර, විනය පරීක්ෂණයේදී ලියවිලි සහ සාක්ෂිකරුවන් ඉදිරිපත් කළ යුතුය.

vi. සති දෙකක (2) දිගුවක් ලබා දීමෙන් පසුවද, අදාළ සාමාජිකයා පැමිණ නොසිටි නම්, පරීක්ෂණය ඒකපාර්ශවීයව පැවැත්වීම සිදු කළ හැකිය.

vii. විධිමත් පරීක්ෂණ මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් පරීක්ෂණයෙහි නිගමනය, හා එයට පදනම් වූ හේතු, පරීක්ෂණ මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ගේ අත්සන් සහිතව සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

viii. විධිමත් පරීක්ෂණ මණ්ඩලයෙහි (වි.ප.ම.) නිගමනයන් හැකි ඉක්මණින් කළමනාකරණ කමිටුවෙහි ඊළඟට එළඹෙන පළමුවන සභාවාරයේදී සාකච්ඡාවට භාජනය කරනු ලබන අතර, විධිමත් පරීක්ෂණ මණ්ඩලයෙහි (වි.ප.ම.) සාමාජිකයින් එම සාකච්ඡාවට සහභාගි නොවනු ඇත.

ix. සාමාජිකයා චෝදනාවලට වරදකරු බවට විධිමත් පරීක්ෂණ කමිටුව කළ නිගමනයට කළමනාකරණ කමිටුව එකගතාවය පළ කරන්නේ නම්,

අ). සුළු වරදක් සම්බන්ධයෙන්, මුල් නියෝගය තහවුරු කරනු ලබයි.

ආ). බරපතල වරදක් සම්බන්ධයෙන් පහත සඳහන් 9.4 වගන්තියෙහි දැක්වෙන විනය නියෝගවලින් කවර නියෝගයක් ක්‍රියාත්මක කළ යුතුද යන්න තීරණය කරනු ලබයි.

x. විධිමත් පරීක්ෂණ කමිටුවෙහි නිගමනයන් සමග කළමනාකරණ කමිටුව එකඟ නොවන්නේ නම්, කළමනාකරණ කමිටුව විසින් එම නිගමනයන් ප්‍රතික්ෂේප කර , එසේ කිරීමට හේතු සටහන් කර වාර්තා කර විනය නියෝග ස්වකීය අභිමතය පරිදි තීරණය කර ක්‍රියාත්මක කරනු ඇත.

xi. ඉහත (ix) හා (x) යටතේ ගත් තීරණ ප්‍රධාන ලේකම් විසින් අදාල සාමාජිකයා වෙත කළමනාකරණ කමිටුවේ තීරණයේ සිට දින 05 ක් ඇතුලත ලියාපදිංචි තැපැලෙන් දැන්විය යුතුය.

## 9.4. අනුමත කරන ලද විනය නියෝග

i. අවවාද කිරීම

ii. තරවටු කිරීම

iii. තදින් තරවටු කිරීම

iv. සමාව අයදීමට නියෝග කිරීම. දින 30 ක් ඇතුලත අනුගමනය නොකළහොත් පහත (viii) අදාල වේ.

v. **අ).** සිදු කළ මුල්‍ය පාඩුව, විනය නියෝගයේ සිට මාස 03 ක් ඇතුළත පියවීමට නියෝග කිරීම.

**ආ).** සංගමයේ හා ඊට අනුබද්ධ ආයතනවල හා අනුබද්ධ අරමුදල්වල කිසිදු නිලයක් දැරීම නිශ්චිත කාලපරිච්ඡේදයකට තහනම් කිරීම.

vi. ඉහත දැක්වෙන (v) (අ) ට අනුකූලතාවය නොදැක්වීමේ හේතුවෙන් සාමාජිකත්වය අවසන් කිරීමට සිදු වේ. නීති කෘත්‍යයක් මගින් (හෝ නඩු මගට පිවිසීමෙන්) මුදල අයකර ගැනීම මධ්‍යම කාරක සභාවේ හුදු අභිමතය පරිදි සිදු කෙරෙනු ඇත.

vii. සංගමයෙහි සියලුම තනතුරුවලින් හෝ සංගමයෙහි අස්තිත්වයන්ගේ හා අරමුදල්වල සියලු තනතුරුවලින් ඉල්ලා අස්වන ලෙස දන්වා සිටිනු ලබන අතර, එයට අනුකූලතාව නොදැක්වුවහොත්, සාමාජිකයා එකී සියලු තනතුරුවලින් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා ඉවත් කරනු ලබනවා ඇත.

viii. සාමාජිකත්වය අත්හිටුවීම/ සංගමයෙහි අස්තිත්වයන්හි හෝ අනුබද්ධ අරමුදල්වල කිසිදු නිලතලයක් දැරීම නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා තහනම් කිරීම.

## 10. කළමනාකරණ කමිටුව වෙත අභියාචනය කිරීමේ ක්‍රියාපටිපාටිය

i. යම්කිසි අයකු, තමන්ට එරෙහිව ලබා දුන් විනය නියෝගයන් සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කිරීමට කැමැත්තේ නම්, එම පුද්ගලයා විසින් ඔහු/ ඇය වෙත විනය නියෝගය දැනුම් දෙන ප්‍රධාන ලේකම්ගේ නිවේදනයේ දින සිට දින 14 ක් ඇතුළත, සංගමයේ සභාපති වෙත සිය අභියාචනය ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

ii. එබදු අභියාචනයක් ඉදිරිපත් කළ විටෙකදී, සභාපති විසින් කළමනාකරණ කමිටු සාමාජිකයින් නොවන සංගමයේ සාමාජිකයන් තිදෙනෙකුගෙන් (03) සමන්විත අභියාචනා කමිටුවක් පත් කරනු ලබන අතර, එම කමිටුවේ සභාපති වශයෙන් ඉන් එක් සාමාජිකයෙකු පත් කළ යුතුය. එම අභියාචනා කමිටුවට සභාපති, අදාල ලියකියවිලි සියල්ලම භාරදිය යුතුය.

iii. අභියාචනා කමිටුව රැස්වී අභියාචනය සම්බන්ධව සලකා බලා, ස්වකීය නිගමනය සංගමයේ සභාපතිවරයා වෙත දින 30 ක් ඇතුලත දැනුම් දිය යුතුය.

iv. මූලික විමර්ශන කමිටුවේ හා අභියාචනා කමිටුවේ සියලුම සාමාජිකයින් සංගමයේ සභාපතිතුමාගේ මූලිකත්වයෙන් තීරක මණ්ඩලයක් ලෙස කටයුතු කරමින් සියලු අදහස් සලකා බලා හැකිතාක් දුරට එකගත්වයකට පැමිණ චූදිත සාමාජිකයා චෝදනා සියල්ලටම හෝ කිහිපයකට වැරදිකරුද, නොඑසේ නම් නිවැරදිකරුද යන්න වැඩි ඡන්දයෙන් තීරණය කල යුතු වේ. (යම් හෙයකින් ඡන්දය සමාන වූ අවස්ථාවක සංගමයේ සභාපතිතුමා එම තීරක ඡන්දය භාවිතා කල හැක.)

v. තීරක මණ්ඩලයේ නිර්දේශ පදනම් කර ගනිමින් කළමනාකරණ කමිටුව සුදුසු විනය ක්‍රියා මාර්ග ගැනීම හෝ චූදිත සාමාජිකයා චෝදනාවලින් නිදහස් කිරීම සිදු කල යුතු අතර , ඒ බව මහ ලේකම් විසින් සාමාජිකයා වෙත ලියාපදිංචි තැපැලෙන් □□□□□ □□□□□ □□□□ වේ.

vi. අභියාචනා කමිටුවෙහි තීරණය අනුව සාමාජිකයා එකක් හෝ ඊට වැඩි වරදවල්වලට වරදකරු බවට කළමනාකරණ කමිටුව එකඟ වන්නේ නම්, 9.4 හි දක්වා ඇති විනය නියෝගවලින් සුදුසු විනය නියෝගයක් අභියාචනා කමිටුවේ නිර්දේශ සලකා බලමින් ක්‍රියාත්මක කළ හැක. එම නියෝගය මහලේකම් විසින් සාමාජිකයාට ලියාපදිංචි තැපැලෙන් දැන්විය යුතුය.

vii. මෙම කරුණ මධ්‍යම කාරක සභාව වෙත එහි ඊළඟ රැස්වීමේදී වාර්තා කළ යුතුය.

## 11. වාර්ෂික මහා සභා රැස්වීම

i. මධ්‍යම කාරක සභාවෙහි වාර්ෂික මහා සභා රැස්වීම එක් එක් වර්ෂයෙහි අප්‍රේල් 30 වනදා ඉකුත්වීමට පෙර පැවැත්විය යුතුය. කෙසේ වෙතත්

සුවිශේෂ තත්ත්වයක් යටතේ රැස්වීම මැයි 15 වනදා දක්වා කල් දැමිය හැකිය.

ii. දිස්ත්‍රික් ශාඛාවල වාර්ෂික මහා සභා රැස්වීම් එක් එක් වර්ෂයෙහි මාර්තු 20 වනදා ඉකුත්වීමට පෙර පැවැත්විය යුතුය.

iii. දිස්ත්‍රික් ශාඛාවල විමධ්‍යගත අස්තිත්වයන්හි වාර්ෂික මහා සභා රැස්වීම් අදාල වර්ෂයෙහි පෙබරවාරි 25 දින ඉකුත්වීමට පෙර පැවැත්විය යුතුය.

iv. යම්කිසි දිස්ත්‍රික් ශාඛාවක් සිය වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට අපොහොසත් වුවහොත්, මධ්‍යම කාරක සභාව සිය වාර්ෂික මහා සභා රැස්වීම එකී දිස්ත්‍රික් ශාඛාවේ සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් තොරව පවත්වනු ඇත.

## 11.1. සංගමයෙහි වාර්ෂික මහා සභා රැස්වීම්වල න්‍යාය පත්‍රය

වාර්ෂික මහා සභා රැස්වීම සඳහා වූ න්‍යාය පත්‍රයට අනෙකුත් කරුණු අතර, පහත දැක්වෙන කරුණු ඇතුලත් වේ.

අ). රැස්වීම කැඳවීමේ නිවේදනය කියවීම.
ආ). අනුස්මරණ.
ඇ). පසුගිය වාර්ෂික මහා සභා රැස්වීමෙහි වාර්තාව කියවීම හා යෝජනා ස්ථිර කිරිම.
ඈ). ඉකුත් කාලපරිච්ඡේදය තුළ පවත්වන ලද විශේෂ මහා සභා/ සාමාජික මහා සභා රැස්වීම්වල වාර්තා කියවීම හා යෝජනා, ස්ථිර කිරිම.
ඉ). මහලේකම්ගේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරිම.
ඊ). සංගමයෙහි, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශනය යෝජනා ස්ථිර කිරිම.
උ). පළමුවන කාර්තුව සඳහා වූ කළමනාකරණ ගිණුම් සභාගත කිරිම.
ඌ). සංගමයේ මරණාධාර අරමුදලේ ලේකම් වාර්තාව ඉදිරිපත් කිරිම.
එ). විශ්‍රාමිකයින්ගේ මරණාධාර අරමුදලෙහි, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශනය යෝජනා ස්ථිර කර ගැනීම.
ඒ). වැන්දඹුවන්ගේ/ වැන්දඹු ස්වාමි පුරුෂයන්ගේ මරණාධාර අරමුදලෙහි විගණනය කරන ලද ගිණුම් යෝජනා, ස්ථිර කර ගැනීම.
ඔ). වෙනත් අනුබද්ධ අරමුදල/ අරමුදල්වල විගණනය කරන ලද ගිණුම්, යෝජනා ස්ථිර කර ගැනීම.
ඕ). (i) කළමනාකරණ කමිටුවෙහි යෝජනා (ii) දිස්ත්‍රික් ශාඛාවලින් ඉදිරිපත් කෙරුණු උපදේශක කවුන්සිලය විසින් නිර්දේශ කරන ලද යෝජනා, (iii) උපදේශක කවුන්සිලයෙහි යෝජනා, ස්ථිර කර අනුමත කර ගැනීම.

ක). මරණාධාර අරමුදල් කමිටුව තෝරා පත් කර ගැනීම.
ග). බැහැර යන සභාපතිවරයාගේ දේශනය.
ච). තාවකාලික සභාපතිවරයෙකු පත්කර ගැනීම
ජ). කළමනාකරණ කමිටුව තෝරාපත් කර ගැනීම.
ට). ව්‍යවස්ථාවේ වගන්ති අංක 25 (i) ට අනුව (විගණකවරයෙකු තෝරාපත් කර ගැනීම) (i) සංගමයේ අරමුදල්, (ii) මරණාධාර අරමුදල්, (iii) හා වෙනත් අරමුදල් ගිණුම් වාර්තා විගණනය කිරීම හා සහතික කිරීම සඳහා .
ඩ). සංගමයේ කළමනාකරණ කමිටුව මෙහෙයවන ගිණුම් සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත් කර ගැනීම.
ත). නව සභාපතිවරයාගේ දේශනය.
ද). වෙනත් කරුණු

## 11.2. දිස්ත්‍රික් ශාඛාවන්හි වාර්ෂික මහා සභා රැස්වීම්වල න්‍යාය පත්‍රය

වාර්ෂික මහා සභා රැස්වීම සඳහා වූ න්‍යාය පත්‍රයට, අනෙකුත් කරුණු අතර පහත දැක්වෙන කරුණු ඇතුලත් වේ.

අ). රැස්වීම කැඳවීමේ නිවේදනය කියවීම.
ආ). අනුස්මරණ.
ඇ). පසුගිය වාර්ෂික මහා සභා රැස්වීමෙහි වාර්තාව කියවීම හා යෝජනා ස්ථිර කිරීම.
ඈ). ඉකුත් කාලපරිච්ඡේදය තුළ පවත්වන ලද විශේෂ මහා සභා රැස්වීම්වල වාර්තා කියවීම හා යෝජනා ස්ථිර කිරීම.
ඉ). ගරු ලේකම්ගේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම.
ඊ). දිස්ත්‍රික් ශාඛාවෙහි, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශනය යෝජනා ස්ථිර කිරීම.
උ). මධ්‍යම කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට සාමාජිකයින් විසින් යෝජනා ස්ථිර කරන ලද යෝජනා අනුමත කිරීම.
ඌ). දිස්ත්‍රික් ශාඛාවේ බැහැර යන සභාපතිගේ දේශනය.
එ). තාවකාලික සභාපතිවරයෙකු පත් කර ගැනීම.
ඒ). දිස්ත්‍රික් ශාඛාවෙහි කමිටුව පත් කර ගැනීම.
ඔ). ව්‍යවස්ථාවේ පහතින් දක්වා ඇති වගන්ති අංක 25 (iii) ට අනුව විගණකවරයෙකු තෝරාපත් කර ගැනීම.
ඕ). ඉහත දැක්වෙන රීති අංක 7.4.3. (i) අනුව මධ්‍යම කාරක සභාවට නියෝජිතයින් තෝරාපත් කර ගැනීම.
ක). වෙනත් කරුණු

## 11.3. දිස්ත්‍රික් ශාඛාවල විමධ්‍යගත අස්තිත්වයන්හි වාර්ෂික මහා සභා රැස්වීම්

දිස්ත්‍රික් ශාඛාවල විමධ්‍යගත අස්තිත්වයන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය අංක 1 ඇමුණුමෙහි දක්වා ඇත.

## 12. කළමනාකරණ කමිටුවෙහි සහ දිස්ත්‍රික් ශාඛා කමිටුවල රැස්වීම්

කළමනාකරණ කමිටුව සහ දිස්ත්‍රික් ශාඛා කමිටු, අවම වශයෙන් මාස දෙකකට (2) එක් වරක් හෝ රැස්විය යුතුය.

## 13. විශේෂ මහා සභා රැස්වීම්

i. කළමනාකරණ කමිටුව විසින් ස්වකීය අභිමතය පරිදි හෝ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින් පනහකට (50) නොඅඩු සංඛ්‍යාවකගේ අත්සනින් යුතුව ඉල්ලීමක් ඉදිරිපත් කැරුණු විටෙකදී හෝ ඉතාමත් වැදගත් කාරණාවක් අරභයා, විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය හැකි වන අතර, ඒ සෑම අවස්ථාවකදීම රැස්වීම කැඳවීමේ අරමුණ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින් වෙත පැහැදිලිව දන්වා සිටිය යුතුය.

ii. දිස්ත්‍රික් ශාඛා කමිටුව විසින් ස්වකීය අභිමතය පරිදි හෝ දිස්ත්‍රික් ශාඛාවේ සාමාජිකයින් විස්සකට (20) නොඅඩු සංඛ්‍යාවකගේ අත්සනින් යුතුව ඉල්ලීමක් ඉදිරිපත් කැරුණු විටෙකදී හෝ ඉතාමත් වැදගත් කාරණාවක් අරභයා, දිස්ත්‍රික් ශාඛාවෙහි විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය හැකි වන අතර, ඒ සෑම අවස්ථාවකදීම රැස්වීම කැඳවීමේ අරමුණ දිස්ත්‍රික් ශාඛා සාමාජිකයින් වෙත පැහැදිලිව දන්වා සිටිය යුතුය.

## 14. මහා සාමාජිකත්වයේ සභා රැස්වීම්

i. මහා සාමාජිකත්වයේ රැස්වීමක් කැඳවීම තම අභිමතය පරිදි මධ්‍යම කාරක සභාවට හෝ සාමාජිකයින් දෙසියයකට (200) නොඅඩු සංඛ්‍යාවකගේ අත්සනින් යුතුව ඉල්ලීමක් කැරුණු විටෙකදී හෝ ඉතාමත් වැදගත් කාරණාවක් අරභයා විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය හැකි අතර, එම රැස්වීම කැඳවීමේ අරමුණ පැහැදිලිව මහා සාමාජිකත්වය වෙත දන්වා සිටිය යුතුය.

ii. මධ්‍යම කාරක සභාවේ ගන්නා ලද තීරණයන් ඇතුලුව ඕනෑම කරුණක් සම්බන්ධයෙන් බහුතරයකගේ ඡන්දය අනුව තීරණයක් ගැනීම , අනුමත

කිරීම හෝ ඉවත දැමීම සඳහා මහා සාමාජිකත්වය වෙත බලය පැවරී ඇත.

## 15. රැස්වීම්වලදී ඡන්දය පාවිච්චි කිරීම

එක් සාමාජිකයකු එක් ඡන්දයක් සඳහා හිමිකම ලබයි. ඡන්දය ප්‍රකාශ කිරීම අත් එසවීමෙන් හෝ සභාව විසින් තීරණය කරන වෙනත් අයුරකින් සිදු කළ හැකිය. ඡන්දය ප්‍රකාශ කිරීම එක සමාන වුවහොත් සභාපතිවරයාට අමතර ඡන්දයක් පාවිච්චි කළ හැක.

## 16. රැස්වීම් සම්බන්ධව දැනුම් දීම

i. මධ්‍යම කාරක සභා රැස්වීම් සඳහා සති 02 ක (දින 14 ක) දැනුම් දීමේ කාලයක් ලැබෙනු ඇත.

ii. කළමනාකරණ කමිටු රැස්වීමක් හෝ දිස්ත්‍රික් ශාඛා කමිටු රැස්වීමක් සඳහා එක් සතියක (දින 7) දැනුම් දීමේ කාලයක් ලැබෙනු ඇත.

iii. උපදේශක කවුන්සිල සාමාජික රැස්වීම් සඳහා සති 02 ක (දින 14 ක) දැනුම්දීමේ කාලයක් ලැබෙනු ඇත.

iv. විශේෂ මහා සභා රැස්වීමක් සඳහා සති 02 ක (දින 14 ක) දැනුම් දීමේ කාලයක් ලැබෙනු ඇත.

v. මහා සාමාජිකත්වයේ රැස්වීමක් සඳහා සති 02 ක (දින 14 ක) කාලයක් ලැබෙනු ඇත.

vi. මධ්‍යම කාරක සභාවේ/ දිස්ත්‍රික් ශාඛාවන්හි වාර්ෂික මහා සභා රැස්වීම් සඳහා සති දෙකක (දින 14 ක) ලිඛිතව දැනුම් දීමේ කාලයක් අවශ්‍ය වන අතර එම නිවේදනය සමග රැස්වීමේ න්‍යාය පත්‍රයෙහි පිටපතක් යැවිය යුතුය.

vii. මධ්‍යම කාරක සභාවෙහි/ කළමනාකරණ කමිටුවෙහි හා දිස්ත්‍රික් ශාඛාවන්හි කමිටුවල හදිසි රැස්වීම් සඳහා පැය 24 ක දැනුම් දීමේ කාලයක් ලැබෙනු ඇත.

## 17. රැස්වීම්වල ගණ පූරණය

i. මධ්‍යම කාරක සභා □□□□□□□□ □□□□ □□□□□□□□ □□□□□□□□□□□ එකසිය පනහකි. (150)

ii. මහා සභා රැස්වීම සඳහා ගණපූරණය සාමාජිකයින් පන්සියයකි. (500)

iii. කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා නිලධාරීන් 02 කු සමග ගණපූරණය සාමාජිකයින් අටකි. (08)

iv. දිස්ත්‍රික් ශාඛාවක වාර්ෂික මහා සභා රැස්වීම/ විශේෂ මහා සභා රැස්වීම සඳහා ගණපූරණය මුළු සාමාජිකත්වයෙන් 30% හෝ සාමාජිකයින් සියයක් (100) යන දෙකෙන් අඩු සංඛ්‍යාව.

v. උපදේශක කවුන්සිලය සඳහා ගණපූරණය සාමාජිකයින් විස්සකි. (20)

vi. දිස්ත්‍රික් ශාඛා කමිටුවක රැස්වීම සඳහා නිලධාරීන් 02 කු සමග ගණපූරණය සාමාජිකයින් පහකි. (05)

## 18. දායක මුදල

**i.** සෑම සාමාජිකයෙකුම මාසික දායක මුදල වශයෙන් රුපියල් එකසිය පනහක් (රු.150/=) පමණක් සංගමය වෙත ගෙවිය යුතු වන අතර, එම මුදල සාමාජිකයාගේ මාසික විශ්‍රාම වැටුපෙන් අඩුකර ගනු ලැබේ . මේ සඳහා සාමාජිකයා විසින්, බලය පවරන ලද ලිපියක් බැංකුව වෙත ලබා දිය යුතුය.

**ii.** මධ්‍යම කාරක සභාව විසින් කළමනාකරණ කමිටුව හරහා මාසිකව රුපියල් සියයක් (රු.100/=) පමණක් වන මුදලක්, එක් සාමාජිකයකු වෙනුවෙන් දිස්ත්‍රික් ශාඛාව වෙත ගෙවනු ලැබේ.

## 19. විශේෂ ස්වේච්ඡා ආධාර/ පරිත්‍යාග/ අරමුදල් රැස් කිරීම

සංගමයේ කළමනාකරණ කමිටුව සහ/ හෝ දිස්ත්‍රික් ශාඛා කමිටුව විසින් තම සාමාජිකයින්ගෙන් (රීති අංක 18 න් බාහිරව) හා පරිත්‍යාගශීලින්ගෙන් ස්වේච්ඡාවෙන් කරනු ලබන විශේෂ ආධාර ලබා දෙන ලෙස ඉල්ලා සිටිය හැක. එමෙන්ම අරමුදල් රැස් කිරීමේ සහ විශේෂ ව්‍යාපෘති සඳහා පරිත්‍යාග ලබාගත හැක.

## 20. ගෙවීම පැහැර හැරීම

කළමනාකරණ කමිටුව වෙනත් තීරණයක් ගතහොත් හැර මාස 03 ක කාලයක්, දායක මුදල් ගෙවීම පැහැර හරින සාමාජිකයකුහට, එම හේතුව නිසාම, සිය සාමාජිකත්වය අහිමි වෙයි.

## 21. සංගමයේ සභාපතිවරයාගේ කාර්යයන්

i. මධ්‍යම කාරක සභාවේ, කළමනාකරණ කමිටුවේ හා උපදේශක කවුන්සිලයේ සභා රැස්වීම්වල සභාපතිත්වය උසුලයි.

ii. 21 (i) හි දැක්වෙන රැස්වීම්වලදී ගනු ලබන සියලුම තීරණ ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම.

iii. නිල බලයෙන් සියලුම උප කමිටුවල සාමාජිකයෙකු වෙයි.

iv. සභාපතිවරයා නොමැති විටෙක, එක් උප සභාපතිවරයෙකු, සභාපතිවරයා වෙනුවෙන් වැඩ බැලීමේ පදනම යටතේ ක්‍රියා කරනු ඇත.

## 21.1. දිස්ත්‍රික් ශාඛාවක සභාපතිවරයාගේ කාර්යයන්

i. දිස්ත්‍රික් ශාඛාවෙහි සහ එහි කමිටුවල සියලුම රැස්වීම්වල සභාපතිත්වය උසුලයි.

ii. 21.1.i හි දැක්වෙන රැස්වීම්වලදී ගනු ලබන සියලුම තීරණ ක්‍රියාත්මක වන බවට වග බලා ගැනීම.

iii. නිල බලයෙන් දිස්ත්‍රික් ශාඛාවේ සියලුම උපකමිටුවල සාමාජිකයෙකු වෙයි.

iv. සභාපතිවරයා නොමැති විටෙකදී උප සභාපතිවරයා, සභාපතිවරයා වෙනුවෙන් වැඩ බැලීමේ පදනම යටතේ ක්‍රියා කරනු ඇත.

## 22. මහ ලේකම්ගේ කාර්යයන්

i. මධ්‍යම කාරක සභාවෙහි, කළමනාකරණ කමිටුවෙහි සහ උපදේශක කවුන්සිලයෙහි සියලුම රැස්වීම්වලට සහභාගි වී සියලුම රැස්වීම් වාර්තා ගත කළ යුතුය.

ii. මධ්‍යම කාරක සභාවෙහි/ කළමනාකරණ කමිටුවෙහි/ උපදේශක කවුන්සිලයෙහි තීරණයන් දැනුම් දීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

iii. නිලබලයෙන්, සියලුම උප කමිටුවල සාමාජිකත්වය දරනු ඇත.

iv. සංගමයෙහි සාමාන්‍ය පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වගකීම දැරිය යුතුය.

v. සංගමයෙහි සියලුම චංචල දේපල සම්බන්ධයෙන් භාණ්ඩ ලේඛනයක් පවත්වාගත යුතුය.

vi. සංගමයෙහි උප ලේකම්වරුන් මහ ලේකම්වරයා හට සහාය වනු ඇත.

## 22.1. දිස්ත්‍රික් ශාඛාවෙහි, ලේකම්වරයා සතු කාර්යයන්

i. දිස්ත්‍රික් ශාඛාවෙහි හා එහි කමිටුවල සියලුම රැස්වීම්වලට සහභාගි වී ඒවා වාර්තා කළ යුතුය.

ii. එම රැස්වීම්වල තීරණයන් දැනුම් දීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතුය.

iii. දිස්ත්‍රික් ශාඛාවෙහි සාමාන්‍ය පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වගකිව යුතුය.

iv. දිස්ත්‍රික් ශාඛාවෙහි සියලුම චංචල දේපල සම්බන්ධයෙන් භාණ්ඩ ලේඛනයක් පවත්වාගත යුතුය.

vii. නිලබලයෙන් ශාඛාවේ සියලුම උප කමිටුවල සාමාජිකත්වය දරනු ඇත.

v. දිස්ත්‍රික් ශාඛාවේ උපලේකම්, ලේකම් හට සහාය විය යුතුය.

## 23. සංගමයේ භාණ්ඩාගාරිකවරයාගේ කාර්යයන්

i. සංගමය වෙත ලැබෙන සියලුම මුදල් සහ ගෙවීම් සම්බන්ධව සත්‍ය ලේඛනයක්/ වාර්තාවක් පවත්වාගත යුතුය.
අ). කළමනාකරණ කමිටුවෙන්
ආ). වෙනත් ආකාරයෙන් ලැබෙන මුදල් පරිහරණය ගිණුම් ගත කිරීම සඳහා වෙන් වෙන්ව ගිණුම් 02 ක් පවත්වාගත යුතුය.

ii. සංගමයේ සියලු වත්කම් සම්බන්ධයෙන් හා සියලුම මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් වගකීම දැරිය යුතුය.

iii. කළමනාකරණ කමිටුවේ රැස්වීම් දෙකක් අතර කාල පරාසය තුළ වියදම් කළ හැකි සීමාවන්,
අ).තමන්ගේ වගකීම යටතේ, සංගමයෙහි මුදල් රුපියල් විසිදහස (රු.20,000/=) දක්වා වැය කිරීමට බලය ලැබෙනු ඇත.
ආ). මුදල් රුපියල් විසිදහස (රු.20,000/=) ඉක්මවන රුපියල් පනස්දහස (රු.50,000/=) දක්වා වූ වියදම් සම්බන්ධයෙන් සභාපතිවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

ඇ). රු.50,000/= ඉක්මවා වියදම් කළ හැක්කේ කළමනාකරණ කමිටුවේ පූර්ව අනුමැතිය යටතේ පමණි.

iv. ඉහත සඳහන් රීති 23 (iii) ට අනුව සිදු කරනු ලබන සියලුම වියදම් කළමනාකරණ කමිටුවේ ඊළඟ රැස්වීමේදී ආවරණ අනුමැතිය සඳහා වාර්තා කළ යුතුය. කෙසේ වෙතත් එබඳු වියදම් කිරීමක් සිදු කර මාස 02 ක් ඇතුලත කළමනාකරණ කමිටුවෙහි රැස්වීමක් නොපැවැත්වුනු අවස්ථාවකදී භාණ්ඩාගාරිකවරයා විසින් කළමනාකරණ කමිටු සාමාජිකයින් අතර සංසරණය මගින් එම වියදම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගත යුතු වන්නේය.

v. සංගමයෙහි භාණ්ඩාගාරිකවරයා විසින් රු.15,000/=ක් සුළු මුදල් අග්‍රිමය ලෙස, තමන් සන්තකයේ තබා ගැනීමට බලය ලැබෙන්නේය.

vi. භාණ්ඩාගාරිකවරයාගේ විෂය පථය යටතේ ගැනෙන සියලුම කටයුතුවලදී ඔහුට සහාය වීමත්, භාණ්ඩාගාරිකවරයා නොමැති විටක වැඩ බැලීමේ පදනම යටතේ කටයුතු කිරීමත් උප භාණ්ඩාගාරිකවරයා විසින් සිදු කරනු ලැබේ.

vii. නිලබලයෙන් සංගමයේ සියලුම උපකමිටුවල සාමාජිකත්වය දරයි.

## 23.1. දිස්ත්‍රික් ශාඛාවෙහි භාණ්ඩාගාරිකවරයාගේ කාර්යයන්

i. දිස්ත්‍රික් ශාඛාව වෙත ලැබෙන සියලුම මුදල් සම්බන්ධව සත්‍ය ලේඛනයක් හෝ වාර්තාවක් පවත්වාගත යුතුය.

අ). කළමනාකරණ කමිටුවෙන්
ආ). වෙනත් ආකාරයෙන් ලැබෙන මුදල් පරිහරණය ගිණුම් ගත කිරීම සඳහා වෙන් වෙන්ව ගිණුම් 02 ක් පවත්වාගත යුතුය.

ii. දිස්ත්‍රික් ශාඛාවෙහි සියලුම වත්කම් සම්බන්ධයෙන් හා සියලුම මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් වගකීම දැරිය යුතුය.

iii. දිස්ත්‍රික් ශාඛා කමිටුවේ රැස්වීම් දෙකක් අතර කාලපරාසය තුළ වියදම් කළ හැකි සීමාවන්,

අ). තමන්ගේ වගකීම යටතේ දිස්ත්‍රික් ශාඛාවෙහි අරමුදල්වලින් රුපියල් දස දහස (රු.10,000/=) දක්වා, වැය කිරීමට බලය ලැබෙනු ඇත.

ආ). රුපියල් දසදහස (රු.10,000/=) ඉක්මවන රුපියල් විසිදහස (රු.20,000/=) දක්වා වූ වියදම් සම්බන්ධයෙන් සභාපතිවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

ඇ). රු.20,000/= ඉක්මවා වියදම් කළ හැක්කේ ශාඛා කමිටුවේ පූර්ව අනුමැතිය යටතේ පමණි.

iv. රීතී 23.1 (iii) ට අනුව සිදු කරනු ලබන සියලුම වියදම් දිස්ත්‍රික් ශාඛා කමිටුවේ ඊළඟ රැස්වීමේදී, ආවරණ අනුමැතිය සඳහා වාර්තා කළ යුතුය. කෙසේ වෙතත්, එබදු වියදම් කිරීමක් සිදු කර මාස 02 ක් ඇතුලත දිස්ත්‍රික් කමිටුවෙහි රැස්වීමක් නොපැවැත්වූ අවස්ථාවකදී භාණ්ඩාගාරිකවරයා විසින් දිස්ත්‍රික් ශාඛා කමිටු සාමාජිකයින් අතර සංසරණය මගින් එම වියදම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගත යුතු වන්නේය.

v. දිස්ත්‍රික් ශාඛාවෙහි භාණ්ඩාගාරිකවරයාට රුපියල් හත්දහස පන්සියයක් (රු.7,500/=) සුළු මුදල් අග්‍රිමය ලෙස, තමන් සන්තකයේ තබා ගැනීමට බලය ලැබේ.

vi. භාණ්ඩාගාරිකවරයාගේ විෂය පථය යටතේ ගැනෙන සියලුම කටයුතුවලදී ඔහුට සහාය වීමත්, භාණ්ඩාගාරිකවරයා නොමැති විටෙක, වැඩබැලීමේ පදනම මත කටයුතු කිරීමත්, උප භාණ්ඩාගාරිකවරයා විසින් සිදු කරනු ලබයි.

vii. නිලබලයෙන් ශාඛාවේ සියලුම උපකමිටුවල සාමාජිකත්වය ලබයි.

## 24. මුදල් වර්ෂය

සංගමයෙහි/ දිස්ත්‍රික් ශාඛාවෙහි මුදල් වර්ෂය දෙසැම්බර් 31 දිනෙන් අවසන් වේ.

## 25. විගණන

**i.** අ). සංගමයෙහි හා ආ). මරණාධාර අරමුදලෙහි සහ ඇ). අනුබද්ධ අරමුදල්හි ගිණුම් විගණනය කර, වර්ෂයේ ගිණුම් ප්‍රකාශන සහතික කිරීම සඳහා සුදුසුකම්ලත් විගණකවරයෙකු (වරලත් ගණකාධිකාරී/ වරලත් කළමනාකරණ ගණකාධිකාරී/ සහතිකලත් රජයේ ගණකාධිකාරී) මධ්‍යම කාරක සභාවෙහිදී තෝරාපත් කරගත යුතුය.

**ii.** අභ්‍යන්තර විගණක කළමනාකරණ කමිටුව මගින් මෙහෙයවනු ලබන ගිණුම්, මාසිකව හෝ වඩාත් නිරන්තරයෙන් විගණනය කරමින් හා කළමනාකරණ කමිටුව වෙත වාර්තා ඉදිරිපත් කිරීමටත්, එම කමිටුවේ රැස්වීම්වලට අවශ්‍ය විට හෝ ආරාධනයක් ලැබුනු විට සහභාගී වීමටත් , ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය හිමිනොවන, කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු නොවන සුදුසු අභ්‍යන්තර විගණකවරයෙකු ස්වකීය සාමාජිකත්වය අතරින් පත්කර ගත යුතුය.

iii. එපරිද්දෙන්ම, දිස්ත්‍රික් ශාඛා සහ දිස්ත්‍රික් ශාඛාවන්හි විමධ්‍යගත අස්තිත්ව මගින්, ස්වකීය ගිණුම් විගණනය සහ සහතික කර අදාළ වාර්ෂික මහා සභා රැස්වීම් හමුවේ ඉදිරිපත් කිරීම හා යෝජනා ස්ථිර කිරීම සඳහා වගන්ති අංක 25 (i) ට අනුව සුදුසු විගණකවරයෙකු වාර්ෂික මහා සභා රැස්වීම්වලදී පත් කර ගත යුතුය.

අ). කෙසේ වෙතත් විගණකවරයා ලෙස දිස්ත්‍රික් ශාඛා සඳහා වෙනත් දිස්ත්‍රික් ශාඛා සාමාජිකයෙකු හෝ ලංකා බැංකුවේ සහකාර කළමනාකාර ශ්‍රේණියට නොඅඩු නිලධාරියෙකු

ආ). දිස්ත්‍රික් ශාඛා විමධ්‍යගත අස්තිත්වයන් සඳහා වෙනත් අස්තිත්වයක සාමාජිකයෙකු තෝරාපත් කර ගත හැකිය.

## 26. අරමුදල්

i. සංගමයෙහි/ දිස්ත්‍රික් ශාඛාවල/ දිස්ත්‍රික් ශාඛාවන්හි විමධ්‍යගත අස්තිත්වවල අරමුදල්, අදාළ කමිටු විසින් තීරණය කරනු ලබන ලංකා බැංකු ශාඛාවන්හි තැන්පත් කරනු ලබන අතර, ඒවායේ ආයෝජනයන් ලංකා බැංකුවේ හා වෙනත් බලපත්‍රලාභී □□□□□ බැංකු, ලංකා බැංකුවේ අනුබද්ධිත මුල්‍ය □□□□, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ රජයේ සුරැකුම්පත්වල අදාල කමිටුවල නිර්දේශ මත සිදු කල හැක.

ii. සංගමයේ අරමුදල් ආපසු ලබා ගැනීමට අත්සන් කරනු ලබන පාර්ශවයන් වනුයේ, භාණ්ඩාගාරිකවරයා හෝ උප භාණ්ඩාගාරිකවරයා සමග සභාපති හෝ මහලේකම් හෝ අදාළ පරිදි ලේකම් වනු ඇත.

iii. කවර ගණයක හෝ අත්සන් කිරීමට බලය ලත් විකල්ප නිලධාරීන් දෙදෙනාම දීර්ඝ කාලයක් සඳහා නොපැමිණි විටෙක කළමනාකරණ කමිටුව/ දිස්ත්‍රික් ශාඛා කමිටුව/

දිස්ත්‍රික් ශාඛාවෙහි විමධ්‍යගත අස්තිත්ව කමිටුව විසින්, කළමනාකරණ කමිටුව/ දිස්ත්‍රික් ශාඛා කමිටුව/ දිස්ත්‍රික් ශාඛාවෙහි විමධ්‍යගත අස්තිත්ව කමිටුව ඇතුළුතින්, නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා, ආදේශකයින් වෙත බලය පැවරීම, සම්මත කර අනුමත කළ යෝජනාවක් ගිණුම පවත්වාගෙන යන බැංකුව වෙත දන්වා යැවීමෙන් සිදු කරනු ඇත.

iv. මහජනතාවගේ පොදු යහපත සඳහා විශේෂිත සුබසාධන කටයුතු

ඉහත සඳහන් අරමුණු සඳහා වැය කරනු ලබන සංගමයේ අරමුදල් පහත දැක්වෙන වගන්ති හා කොන්දේසිවලට යටත් වේ.

## අ). කළමනාකරණ කමිටුව

1. පසුගිය මුල්‍ය වර්ෂාවසානයෙහි සංගමයෙහි සාමාජික සංඛ්‍යාව රු.50/=න් ගුණ කළ විට ලැබෙන සංඛ්‍යාව නොඉක්මවන ප්‍රමාණයකින් කළමනාකරණ කමිටුවේ සෘජු අධීක්ෂණය යටතේ පවතින සංගමයෙහි අරමුදල් කවර හෝ මුල්‍ය වර්ෂයකදී ඉහත දැක්වෙන අරමුණ සඳහා ප්‍රයෝජනයට ගැනීමට කළමනාකරණ කමිටුවට හැකි වේ.

2. මෙම ගණන ඉක්මවීම සඳහා මධ්‍යම කාරක සභාවෙහි පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ.

3. එක් එක් ව්‍යාපෘතිය සඳහා වූ ගිණුම් වාර්තාවන්, ඊළගට පැවැත්වෙන කළමනාකරණ කමිටු රැස්වීමට හා මධ්‍යම කාරක සභා රැස්වීමට අපරානුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

## ආ). දිස්ත්‍රික් ශාඛා

1. දිස්ත්‍රික් ශාඛා සිය අරමුදල් (වියදම දරාගත හැකි නම්), ස්වේච්ඡා දායක මුදල් සහ අරමුදල් රැස්කිරීම් තුළින් ලබාගත් මුදල් මේ සඳහා යොදාගත හැක.
2. දිස්ත්‍රික් ශාඛාවන්ට සිය නිර්දේශ අනුව විමධ්‍යගත අස්තිත්ව විසින් තම ව්‍යාපෘති සඳහා යෙදවූ මුදල් පියවිය හැකිය. එබඳු ව්‍යාපෘතිවල ගිණුම් වාර්තා දිස්ත්‍රික් කමිටුවට සහ දිස්ත්‍රික් ශාඛාවේ මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.
3. එක් එක් ව්‍යාපෘතිය සඳහා වූ ගිණුම් වාර්තාවන්, ඊළගට පැවැත්වෙන දිස්ත්‍රික් කමිටු රැස්වීමට හා දිස්ත්‍රික්කයේ මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.

## ඇ). දිස්ත්‍රික් ශාඛාවේ විමධ්‍යගත අස්තිත්ව

1. දිස්ත්‍රික් ශාඛාවේ විමධ්‍යගත අස්තිත්ව සිය අරමුදල් (වියදම දරාගත හැකි නම්) ස්වේච්ඡා දායක මුදල්, අරමුදල් රැස්කිරීම් තුළින් ලබා ගත් මුදල් සහ දිස්ත්‍රික් ශාඛාවෙන් ලබා දෙන මුදල් මේ සඳහා යොදා ගත හැක.
2. එබඳු ව්‍යාපෘතිවල ගිණුම් වාර්තා විමධ්‍යගත අස්තිත්වයේ ඊළඟ කමිටු රැස්වීමට ඉදිරිපත් කර , දිස්ත්‍රික් ශාඛා කමිටුවට සහ විමධ්‍යගත අස්තිත්වයේ ඊළග මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.

## 27. අනුබද්ධ අරමුදල්

i. සංගමයෙහි සාමාජිකයන්ගේ යහපත සඳහා කටයුතු කිරීමට ස්වාධීන අනුබද්ධ අරමුදල් පැවතිය යුතුය.

ii. එබඳු අරමුදල් ෙ“ දකක් ලංකා බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමයේ මරණ ා“ ධාර අරමුදල හා ලංකා බැංකු විශ්‍රාමිකයින්ගේ වැන්දඹු හ’ ා වැන්දඹු ස්වාමි පුරුෂයන්ගෙ ඇත.

iii. සංගමයෙහි වාර්ෂික මහා සභා රැස්වීමෙහිදී තෝරාපත් කර ගන්නා ලද මරණාධාර අරමුදල් කමිටුවක් මගින් මෙම අරමුදල් දෙක කළමනාකරණය කරනු ලබයි.

iv. මෙම අරමුදල් දෙක සංගමයෙහි කළමනාකරණ කමිටුවේ විෂය පථය යටතෙහි වේ.

v. වෙනත් අරමුදල්, කළමනාකරණ කමිටුව මගින් ඍජුව හෝ වක්‍රව කළමනාකරණය කරනු ඇත.

vi. එකී අරමුදල්වල මූල්‍ය තත්ත්වය කළමනාකරණ කමිටුව වෙත මාසිකව වාර්තා කළ යුතුය.

vii. ලංකා බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමයේ මරණාධාර අරමුදල්වල රීති හා රෙගුලාසි, ඇමුණුම (ii) වශයෙන් අමුණා ඇත.

## 28. යෝජනා

### i. සියලුම යෝජනා

සියලුම යෝජනා, එම දිස්ත්‍රික් ශාඛාවෙහිම සාමාජිකයන් විසින් ස්ථිර කරන ලදුව, එක් එක් වර්ෂයෙහි ජනවාරි මස අවසන් දිනට ප්‍රථම දිස්ත්‍රික් ශාඛාවෙහි ගරු ලේකම්වරයා වෙත ලැබිය යුතුය.

ii. දිස්ත්‍රික් ශාඛාව විසින් සුදුසු යැයි සලකනු ලබන යෝජනා , එක් එක් වර්ෂයෙහි පෙබරවාරි මස අවසන් දිනට ප්‍රථම සංගමයෙහි මහ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

iii. මහලේකම්වරයා විසින් එම යෝජනා උපදේශක කවුන්සිලයේ ඊළඟ සභාවාරයෙහිදී සභාගත කිරීමට කටයුතු සම්පාදනය කරනු ඇත.

iv. දිස්ත්‍රික් ශාඛා මගින් ඉදිරිපත් කරනු ලබන යෝජනා , නිර්දේශ කිරීම/ සංශෝධනය කිරීම/ ප්‍රතික්ෂේප කිරීම/ ඒකාබද්ධ කිරීම හා ස්වකීය

වශයෙන් යෝජනා ඉදිරිපත් කිරීම පිළිබඳ අයිතිය උපදේශක කවුන්සිලය සතුය.

**v.** ස්වකීය යෝජනා මධ්‍යම කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමේ අයිතිය කළමනාකරණ කමිටුව සතු වේ.

**vi.** කළමනාකරණ කමිටුව/ උපදේශක කවුන්සිලය විසින් නිර්දේශ කරන ලද ඕනෑම යෝජනාවක් සංශෝධනය කිරීම/ අනුමත කිරීම/ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ අයිතිය මධ්‍යම කාරක සභාව සතු වේ.

## 29. ව්‍යවස්ථාව සඳහා සංශෝධන

i. **සංගමයේ** වාර්ෂික මහා සභා රැස්වීමකදී හෝ මධ්‍යම කාරක සභාවෙහි විශේෂ මහා සභා රැස්වීමකදී හෝ ගණපූරණය සහිත මහා සාමාජිකත්වයේ සභා රැස්වීමකදී හැර ව්‍යවස්ථාවට කිසිදු සංශෝධනයක් සිදු නොකළ යුතුය.

ii. කළමනාකරණ කමිටුව හා උපදේශක කවුන්සිලය විසින් මධ්‍යම කාරක සභාව වෙත සෘජුවම සංශෝධන නිර්දේශ කළ හැකි වේ.

iii. ව්‍යවස්ථාව සඳහා වන සංශෝධන දිස්ත්‍රික් ශාඛා විසින් , ලිඛිතව කළමනාකරණ කමිටුව වෙත නිර්දේශ කළ හැකි වන අතර, එබදු සංශෝධන උපදේශක කවුන්සිලය වෙත යොමු කෙරෙන අතර, උපදේශක කවුන්සිලය විසින් දිස්ත්‍රික් ශාඛා විසින් එවනු ලබන එබදු සංශෝධන නිර්දේශ කිරීම/ සංශෝධනය කිරීම/ ප්‍රතික්ෂේප කිරීම/ ඒකාබද්ධ කිරීම සිදු කළ හැක.

iv. ව්‍යවස්ථා සංශෝධන සම්මත කිරීම මධ්‍යම කාරක සභාවේ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයින් 2/3 ක බහුතරයකගේ ඡන්දය ප්‍රකාශ කිරීමෙන් සිදු කළ හැකිය.

## 30. ඈවර කිරීම

සංගමය ඈවර කිරීමේදී සංගමයෙහි බැරට පවතින අරමුදල් යොදවන ආකාරය සම්බන්ධයෙන් මධ්‍යම කාරක සභාව විසින් තීරණයකට එළඹෙනු ඇත.

## 31. ප්‍රතිපාදන සලසා නොමැති කරුණු/ අර්ථකථනය

i. ඉහත සඳහන් රීතීන්ගෙන් ආවරණය නොවන හේතුවක් නිසා පැන නගින ඕනෑම කරුණක් කළමනාකරණ කමිටුව වෙත යොමු කළ යුතු වන අතර, කළමනාකරණ කමිටුවේ තීරණය ආවරණ අනුමැතිය සඳහා මධ්‍යම කාරක සභාව හමුවෙහි තබනු ඇත.

ii. ඉහත සඳහන් රීතීන් අර්ථකථනය කිරීමේදී මධ්‍යම කාරක සභාවේ බහුතර තීන්දුව පිළිගත යුතුය.

## 32. නොගැලපීම්

මෙම නීතී රීතිවල ඉංග්‍රීසි පාඨය හා සිංහල හා දෙමළ අනුවාදය අතර , කිසියම් නොගැලපීමක් ඇති විටෙක, ඉංග්‍රීසි පාඨය බලාත්මක වේ.

මෙම ව්‍යවස්ථාව 2017 දෙසැම්බර් මස 02 වන දින පැවැත්වුණු ලංකා බැංකු විශ්‍රාමික සංගමයේ විශේෂ මහා සභා රැස්වීමෙහිදී සම්මත කොට අනුමත කරගන්නා ලද අතර, 2018 ජනවාරි මස 01 වන දින සිට බලාත්මක වේ.